# ආහාර බෝග වගාවන්ට සිදුවන වන සත්ත්ව හානි අවම කිරීම සඳහා නිර්දේශ සකස් කිරීමේ කමිටු වර්තාව

කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය, ගොවිජන මන්දිරය, බත්තරමුල්ල.

**2025 මැයි**

**ආහාර බෝග වගාවන්ට සිදුවන වන සත්ත්ව හානි අවම කිරීම සඳහා නිර්දේශ සකස් කිරීමේ කමිටුව**

| | |
|---|---|
| ඒ.කේ.ජයවර්ධන<br>අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) | කමිටු සභාපති |
| ආචාර්ය පී.එස්. ප්‍රනාන්දු මිය<br>අතිරේක ලේකම් (පශු සම්පත්) | කමිටු සාමාජික |
| ආචාර්ය ඩබ්.ඒ.ආර්.ටී. වික්‍රමාආරච්චි මයා<br>අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | කමිටු සාමාජික |
| ආචාර්ය ශිරෝමණී එදිරිමාන්න මිය<br>අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |
| ජී.ජී.වී. ශ්‍යාමලී මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |
| ආර්.ඩී.චිත්‍රනයනා මෙනවිය<br>අධ්‍යක්ෂ ජනරාල් (කෘෂි තාක්ෂණ) | කමිටු සාමාජික |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.ජේ.එස්.කේ.ජයකොඩි මයා<br>සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය | කමිටු සාමාජික |
| ලුතිනල් කර්නල් එච්.ටී.පී. කුමාරසිරි මයා<br>වනජීවී දෙපාර්තමේන්තු සම්බන්ධීකාරක, සිවිල් ආරක්ෂක දෙපාර්ත්මේන්තුව | කමිටු සාමාජික |
| මහාචාර්ය ඒ.එල්.සන්දික මයා<br>අධ්‍යක්ෂ,හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය | කමිටු සාමාජික |
| වෛද්‍ය තාරක ප්‍රසාද් මයා<br>අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |
| කේ.ඒ.සුමිත් චන්දන මයා<br>කොමසාරිස් (සේවා), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |
| වෛද්‍ය සංජීක පෙරේරා මයා<br>අධ්‍යක්ෂ (පශු සම්පත්) | කමිටු සාමාජික |
| ජේ.ඒ. තුසිත නන්දන මයා<br>අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | කමිටු සාමාජික |
| අජිත් පුෂ්පකුමාර මයා<br>අධ්‍යක්ෂ (කෘෂි ව්‍යාපාර) | කමිටු සාමාජික |
| ටී.එච්.අමරසිංහ මයා<br>අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) | කමිටු සාමාජික |
| පි.ඩබ්. ප්‍රමුෂ්කා හිරුණි මිය<br>අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | කමිටු සාමාජික |
| චන්ද්‍රානි ජයවික්‍රම මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන - කෘෂිකර්ම අංශය), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |

## 01. කමිටුවේ කාර්යය භාරය / අරමුණ

කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් අතිරේක ලේකම් (කෘෂිකර්ම සංවර්ධන) ගේ සභාපතීත්වයෙන් සහ සාමාජිකයින් 16 දෙනෙකුගෙන් යුතුව පත් කරන ලද මෙම කමිටුව වෙත පැවරී ඇති කාර්යය භාරය වනුයේ ආහාර බෝග වගාවන්ට සිදුවන වන සත්ත්ව හානි අවම කිරීම සඳහා ඉදිරියේදී භාවිතා කිරීම වෙනුවෙන් සුදුසු ක්‍රියාමාර්ග හඳුනාගෙන නිර්දේශ සකස් කිරීම ඉදිරිපත් කිරීමයි.

## 02. අනුගමනය කරණ ලද ක්‍රියාමාර්ග

1. බෝග වගාවන්ට හානිකර වන සතුන්ගේ ගහනයන් සහ එම හානි කර වන සතුන් කළමනාකරණය කිරීම සඳහා භාවිතා කළ හැකි සම්ප්‍රදායික සහ නවීන උපක්‍රම පිළිබඳ අධ්‍යයනයක් සිදුකර තීරණ වලට එළඹීම වඩා සුදුසු බැවින්, ඒ අනුව කටයුතු කරන ලදී. ඒ අනුව ගොවීන් සහ මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ජන කොටස් විසින් ඉදිරිපත් කරණු ලබන විසඳුම් අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීමට පියවර ගන්නා ලදී.

2. දෙවනුව, කමිටුව විසින් ආහාර බෝග වගාවන්ට බහුල වශයෙන් හානි සිදු කරන එමෙන්ම වගා ක්ෂේත්‍ර වලට ඉහලින් පැමිණෙන වන සතුන් වන වඳුරා, රිලවා, දඬුලේනා සහ මොණරා පිළිබඳව ගහන සමීක්ෂණයක් පැවැත්වීමට තීරණය කරන ලදී.

3. ආහාර බෝග වගාවන්ට වඩාත්ම සුලභ හා පීඩාකාරී වන සත්ත්ව කාණ්ඩය ලෙස හඳුනා ගත් ඉහත වන සත්ත්ව කාණ්ඩය පිළිබඳ ගහන සමීක්ෂණය 2025.03.15 දින දිවයින පුරා **"කෘෂිකාර්මික බෝග සඳහා හානි සිදු කරන වන ජීවීන් පිළිබඳ ජාතික සංගණනය 2025"** ලෙස පවත්වන ලදී.

## 03. කෘෂිකාර්මික බෝග සඳහා හානි සිදු කරන වන ජීවීන් පිළිබඳ ජාතික සංගණනය 2025 පැවැත්වීම සහ ප්‍රතිපල සත්‍යාපනය

1. සියලු දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මෙහෙයවීමෙන් සියලුම ග්‍රාම නිලධාරි වසම් තුළ ග්‍රාම නිලධාරීන් ගේ මූලිකත්වයෙන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් කෘපනිස නිලධාරීන් සහ ආර්ථික සංවර්ධන නිලධාරීන් ගේ සහයෝගයෙන් මෙම සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.
2. රජයේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලද සමීක්ෂණ පත්‍රිකා සියලුම ග්‍රාම නිලධාරීන් වෙත සමීක්ෂණ දිනයට කලින් බෙදා හැර නිවෙස් වෙත ලබාදීමට කටයුතු කරන ලදී. සමීක්ෂණයෙන් පසු අදාළ සමීක්ෂණ පත්‍රිකා නැවත ග්‍රාම නිලධාරීන් වෙත ලබාගෙන ඔවුන්ගේ සාරාංශ වාර්තා සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සාරාංශ වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සාරාංශ වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශ වෙතත් ලබා ගන්නා ලදී. සම්පූර්ණ කරන ලද සමීක්ෂණ පත්‍රිකා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කෘෂිකර්ම අංශය සතුව පවතී.

3. ඉහත සත්ත්ව සමීක්ෂණයේ ප්‍රතිඵල 2025 අප්‍රේල් මස වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් අමාත්‍යාංශය වෙත ලැබුණ අතර අනතුරුව එහි සත්‍යාපන කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී.

4. ප්‍රතිඵල සත්‍යාපනයේදී තහවුරු වූයේ ප්‍රජාව විසින් ලබාදෙන ලද වඳුරන් සහ රිලවුන් සම්බන්ධ තොරතුරුවල 50% සත්‍යතාවයක් පවතින බවයි. ඒ අනුව, සමීක්ෂණයේ අදාල සංඛ්‍යාත්මක අගයන්හි 50% ක අගය අගය නිවැරදි අගය ලෙස සැලකීමට කමිටුව තීරණය කරන ලදී.
5. සත්‍යාපන කටයුතු වලින් අනතුරුව අදාල සත්ත්ව කාණ්ඩයේ පැතිරීම, අවධානම් කලාප හඳුනාගත හැකි ලෙස ප්‍රදේශ අනුව සිතියම්ගත කරන ලදී.

## 04. ප්‍රතිඵල සිතියම්ගත කිරීම, නිරීක්ෂණ සහ අදාල දත්ත භාවිතාවන්

1. සිතියම් ගත කිරීම මගින් සත්ව ගහනයන් වැඩිපුර පවතින දිස්ත්‍රික්ක සහ දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් සැලකීමේදී අදාළ දිස්ත්‍රික්කයන් තුළ වැඩි සත්ව ගහනයක් සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හඳුනාගැනීම මෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ වැඩි ගහනයක් පවතින අදාළ ග්‍රාම නිලධාරී වසම් හඳුනා ගැනීමේත් හැකියාව ඇත.

2. සිතියම් නිරීක්ෂණයට අනුව යාපනය,කිළිනොච්චිය, මඩකළපුව හා නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් සාපේක්ෂව යම් අඩු ගහන ව්‍යාප්තියක් පෙන්නුම් කරණ අතර අනෙක් සියළු දිස්ත්‍රික්කයන්හි ආහාර බෝග වගාවන් මෙම වන සත්ත්ව කාණ්ඩයේ ග්‍රහනයට නතුවී ඇති බවත් ඒ අතරින් මහනුවර, අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්ක ඉතා දැඩි ලෙසත් කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පොළොන්නරුව, කෑගල්ල, මොණරාගල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක දැඩි ලෙසත් මෙම සත්ත්ව කාණ්ඩයේ ග්‍රහනයට නතුවී ඇති බව සමීක්ෂණයේ ප්‍රතිඵල මත සමස්තයක් ලෙස පෙනී යයි.

3. සමීක්ෂණයට සමගාමීව සිදු කල මහජන අදහස් විමසීම් සහ සමීක්ෂණයේ ප්‍රතිඵල සත්‍යාපනය වෙනුවෙන් සිදු කළ සහභාගීත්ව ගැමි පිවිසුම් මඟින් ද ඉහත තත්වය තහවුරු වන අතර සෑම අවස්ථාවකදීම ප්‍රජාවගේ දැඩි ඉල්ලීම වූයේ හැකි ඉක්මනින් මේ සඳහා පාලන උපක්‍රම හඳුන්වා දෙන ලෙසයි.

4. එසේම ඉදිරියේදී පාලන උපක්‍රම භාවිතා කිරීමෙන් පසුව ගහනයේ අඩු වැඩිවීම් පිළිබඳව නිරීක්ෂණය කිරීමටද මෙම සමීක්ෂණ දත්ත මූලිකව පාදක කරගත හැක.

5. සමීක්ෂණයේ ප්‍රතිඵල, වගු ලෙස සහ සිතියම් ලෙස වාර්තාවට එකතු කර ඇත. (ඇමිනුම් 01 සිට

## 05. ආහාර බෝග වගාවන්ට සිදුවන වන සත්ත්ව හානි අවම කිරීම සඳහා ඉදිරියේදී භාවිතා කිරීම වෙනුවෙන් යෝජනා කරණු ලබන ක්‍රියාමාර්ග

මෙම සත්ත්ව කාණ්ඩයෙන් සිදු වන වගා හානි පාලනය සඳහා එම ගහනයන් කළමණාකරණය කිරීම සහ වගා භූමි වලට පැමිණීම වැළැක්වීමේ උපක්‍රම හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යව ඇත. විශේෂයෙන්ම සංසන්දනාත්මකව සැලකීමේදී වඩා වැඩි ගහනයන් පවතින අවදානම් කලාප ලෙස හඳුනාගත හැකි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හෝ ග්‍රාම නිලධාරී වසම් වෙත ප්‍රමුඛතාවයක් ලබා දෙමින් මෙම කළමනාකරණ ක්‍රියාවලින් ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු වනු ඇත. මේ සඳහා වඩා තිරසාර වනුයේ ප්‍රජාවට ඔවුන් විසින්ම පවත්වාගෙන යා හැකි ක්‍රමවේදයක් සකසා දීම බව කමිටුවේ

අදහසයි. මේ සඳහා මේ වන විටත් ඉදිරිපත්ව ඇති යෝජනා අතුරින් කමිටුවේ අවධානය යොමු වී පවතින වඩා සාධනීය යෝජනා පහත පරිදි වේ.

1. ඉවතලන ආහාර කිසිවිටකත් වන සතුන්ට ආහාර ලෙස ලබා ගැනීමට නොහැකි වනසේ කසල කලමනාකරණය සිදු කිරීම.
2. ග්‍රාමීය මට්ටමෙන් ප්‍රජා සහභාගීත්වයෙන් බෝග ආරක්ෂක කමිටු පිහිටුවා ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ලෙස බෝග ආරක්ෂකයන් වෙත පතොරම් තුවක්කු ලබා දීම. එසේම බෝග ආරක්ෂක ක්‍රියාමාර්ග වලදී මිය යන සතුන් අපහරණය සඳහා වගා භූමි වල සිට යම්තාක් දුරකට ප්‍රවාහනය කිරීමට අවසර ලබා දීම.

3. රජයේ ආරක්ෂක අංශයක් වන සිවිල් ආරක්ෂක බලකාය වෙත මේ පිළිබඳ වගකීම් පවරා හානි වැඩිපුර පවතින ප්‍රදේශ තුළ ඔවුන් ස්ථානගත කිරීම සහ පතොරම් තුවක්කු භාවිතයෙන් සතුන් පලවා හැරීම සඳහා ඔවුන් වෙත අවසරය ලබාදීම. එසේම මිය යන සතුන් අපහරණය සඳහා ක්‍රමවේදයක් සලසා දීම.

4. දැඩි අවදානම් ප්‍රදේශවලදී ඉක්මන් පියවරක් ලෙස ප්‍රජා සහභාගීත්වයෙන් සාමූහික ලෙස පලවා හැරීමේ ක්‍රියාදාමයන් භාවිතා කිරීම.

5. මෙම මෙම සංගණනයේ දී වාර්තා වී තිබෙන දඹුලේනා සහ මොනරා වන සංරක්ෂිත ප්‍රදේශවලින් පිටත වගාබිම්වල සැරිසරන සතුන් වීමත් වනසත්ව සහ වෘක්ෂලතා ආරකෂක ආඥා පනතට අනුව ආරක්ෂිත වනජීවීන් වීමත් මිනිසුන්ට පීඩාකාරී ලෙස ඔවුන්ගේ ගහනය වැඩි වී පැවතීමත් මත ඉදිරියේදී අපේක්ෂිත ගහණ පාලන උපක්‍රමයන් මෙම සතුන් වෙත යෙදවීමට හැකිවන අයුරින් දැනට පවතින ඔවුන්ගේ සංරක්ෂිත මට්ටම් පහල දැමම සඳහා වනජීවී සංරකෂන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කිරීම.

6. දීර්ග කාලීනව අවධානය යොමු කරමින් වන ජීවී කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායන් භාවිතා කිරීම වෙනුවෙන් නීතිමය පසු බිම සැකසීම සඳහා ඊට අදාලව පවතින නීති යතාවත් කිරීම හෝ නව නීති හඳුන්වා දීම.

7. සතුන් වගා භූමි වලින් පලවා හැරීම සඳහා කාර්යක්ෂම ලෙස භාවිතා කළ හැකි විද්‍යුත් මෙවලම් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් වෙත පර්යේෂණ අවධානය යොමු කිරීම.

8. වන්ද්‍යාකරණය හෝ වෙනත් උපත් පාලන ක්‍රම මගින් සත්ව ගහනය වැඩිවීම පාලනය කිරීම.

9. ප්‍රාදේශීය වශයෙන් ප්‍රතිඵල දායක අවස්ථා වලදී විශාල වගා භූමි විදුලි වැට මඟින් ආරක්ෂා කිරීම.

## 06. තව දුරටත් අවශ්‍ය ඉදිරි පියවර පිළිබඳ නිර්දේශයන්

යෝජිත ඉහත ක්‍රමෝපායන් පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද විධිමත්ව සකස් කිරීම සහ වෙනත් සුදුසු ක්‍රමෝපායන් හඳුනා ගැනීම වෙනුවෙන් ඉදිරි පියවර කිහිපයක් පහත පරිදි තව දුරටත් අනුගමනය කිරීම සුදුසු වනු ඇත.

1. පරිසරවේදීන්, ගොවි සංවිධාන, ප්‍රජා සංවිධාන, පර්යේෂකයින් සහ විද්වත් සංවිධාන ආදී සංවිධානවල අදහස් සහ යෝජනා සාකච්ඡා කිරීම.

2. විවිධ අදහස් සහිත පාර්ශවකරුවන් එක් රැස්කර පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් පැවැත්වීම සහ ඒ තුලින් ක්‍රියාකාරී සැලැස්ම සකසා ගැනීම.

3. මේ වෙනුවෙන් දැනට රට තුළ ක්‍රියාත්මක නියමු ව්‍යාපෘතිවල (මහනුවර) ප්‍රතිඵල සලකා බැලීම.

ඇමුණුම 01

# කෘෂිකාර්මික බෝග සඳහා හානි සිදු කරන වන ජීවීන් පිළිබඳ ජාතික සංගණනය 2025

## සත්ත්ව ගහන ප්‍රමානයන් පිළිබඳ දිස්ත්‍රික් සාරාංශ වාර්තාව

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 13 | 22,192 | 51,895 | 3,414 | 7,997 |
| 2 | ගම්පහ | 13 | 78,072 | 34,780 | 44,427 | 27,716 |
| 3 | කළුතර | 14 | 84,406 | 80,112 | 25,764 | 82,723 |
| 4 | නුවර | 20 | 634,668 | 86,834 | 163,929 | 106,582 |
| 5 | මාතලේ | 11 | 336,437 | 37,126 | 156,267 | 178,774 |
| 6 | නුවර එළිය | 10 | 254,122 | 31,886 | 61,435 | 47,989 |
| 7 | ගාල්ල | 22 | 67,578 | 101,064 | 42,363 | 214,575 |
| 8 | මාතර | 16 | 252,888 | 120,421 | 88,002 | 270,436 |
| 9 | හම්බන්තොට | 12 | 224,297 | 155,452 | 173,958 | 373,932 |
| 10 | යාපනය | 15 | 683 | 21,274 | 1309 | 1370 |
| 11 | කිලිනොච්චි | 4 | 38,241 | 57,007 | 21,242 | 20,445 |
| 12 | මන්නාරම | 5 | 25,747 | 39,104 | 16,649 | 36,961 |
| 13 | වව්නියාව | 4 | 74,361 | 72,158 | 36,188 | 74,747 |
| 14 | මුලතිව් | 6 | 77,156 | 71,145 | 23,459 | 44,303 |
| 15 | මඩකළපුව | 14 | 10,669 | 24,767 | 8,471 | 12,980 |
| 16 | ත්‍රිකුණාමලය | 11 | 73,877 | 69,947 | 34,442 | 56,587 |
| 17 | අම්පාර | 20 | 96,747 | 69,650 | 81,457 | 217,846 |
| 18 | කුරුණෑගල | 30 | 540,958 | 47,224 | 546,715 | 621,517 |
| 19 | පුත්තලම | 16 | 94,163 | 24,904 | 127,905 | 216,553 |
| 20 | අනුරාධපුර | 22 | 461,922 | 160,315 | 296,983 | 581,489 |
| 21 | පොළොන්නරුව | 7 | 152,844 | 108,658 | 86,490 | 185,952 |
| 22 | බදුල්ල | 15 | 358,861 | 54,486 | 139,298 | 203,678 |
| 23 | මොණරාගල | 11 | 307,077 | 98,678 | 258,362 | 459,397 |
| 24 | රත්නපුර | 18 | 385,451 | 71,542 | 153,536 | 190,154 |
| 25 | කෑගල්ල | 11 | 544,104 | 57,199 | 74,565 | 51,042 |
| | **එකතුව** | **340** | **5,197,517** | **1,747,623** | **2,666,630** | **4,285,745** |


ඇමුණුම 02

**කෘෂිකාර්මික බෝග සඳහා හානි සිදු කරන වන ජීවීන් පිළිබඳ ජාතික සංගණනය 2025**
**සත්ත්ව ගහන ගනත්වයන් (Population density) පිළිබඳ දිස්ත්‍රික් සාරාංශ වාර්තාව**

| | දිස්ත්‍රික්කය | භූමි ප්‍රමානය (වර්ග කි.මී.) | සතුන් සංඛ්‍යාව (වර්ග කි.මීටරයට) | | | |
|---|---|---|---|---|---|---|
| | | | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
| 1 | කොළඹ | 676 | 66 | 154 | 2 | 3 |
| 2 | ගම්පහ | 1341 | 116 | 52 | 33 | 21 |
| 3 | කළුතර | 1579 | 107 | 101 | 16 | 52 |
| 4 | ගාල්ල | 1617 | 84 | 125 | 26 | 133 |
| 5 | මාතර | 1270 | 398 | 190 | 69 | 213 |
| 6 | රත්නපුර | 3236 | 238 | 44 | 47 | 59 |
| 7 | හම්බන්තොට | 2496 | 180 | 125 | 70 | 150 |
| 8 | මොණරාගල | 5508 | 112 | 36 | 47 | 83 |
| 9 | බදුල්ල | 2827 | 254 | 39 | 49 | 72 |
| 10 | නුවර එළිය | 1706 | 298 | 37 | 36 | 28 |
| 11 | මහනුවර | 1917 | 662 | 91 | 86 | 56 |
| 12 | මාතලේ | 1952 | 345 | 38 | 80 | 92 |
| 13 | කෑගල්ල | 1685 | 646 | 68 | 44 | 30 |
| 14 | අම්පාර | 4222 | 46 | 33 | 19 | 52 |
| 15 | මඩකළපුව | 2610 | 8 | 19 | 3 | 5 |
| 16 | ත්‍රිකුණාමලය | 2529 | 58 | 55 | 14 | 22 |
| 17 | පොළොන්නරුව | 3077 | 99 | 71 | 28 | 60 |
| 18 | අනුරාධපුර | 6664 | 139 | 48 | 45 | 87 |
| 19 | කුරුණෑගල | 4624 | 234 | 20 | 118 | 134 |
| 20 | පුත්තලම | 2882 | 65 | 17 | 44 | 75 |
| 21 | වව්නියාව | 1861 | 80 | 78 | 19 | 40 |
| 22 | කිලිනොච්චි | 1205 | 63 | 95 | 18 | 17 |
| 23 | මුලතිව් | 2415 | 64 | 59 | 10 | 18 |
| 24 | යාපනය | 929 | 15 | 46 | 1 | 1 |
| 25 | මන්නාරම | 1880 | 27 | 42 | 9 | 20 |
| | | 62705 | 164 | 53 | 42 | 68 |


❖ මෙහිදී ගහන ඝනත්වයන් සැකසීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයන්හි බෝග වගාවන්ට හානි කරන වන සතුන් සැරිසරන භෝග වගා වපසරිය නොව දිස්ත්‍රික්කයේ සම්පූර්ණ භූමි වපසරිය භාවිතා කර ඇත

ඇමුණුම 03




දීප ව්‍යාප්ත වන සත්ත්ව සමීක්ෂණය 2025/03/15
රිලවා
සුචිය ( සතුන් සංඛ්‍යාව )
682 - 38241
38241 - 152844
152844 - 254122
254122- 385450
385450 - 634668
යාපනය
කිලිනොච්චි
මුලතිව්
මන්නාරම
වව්නියා
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
පුත්තලම
පොළොන්නරුව
මඩකළපුව
කුරුණෑගල
මාතලේ
නුවර
අම්පාර
ගම්පහ
කෑගල්ල
කොළඹ
නුවර එළිය
බදුල්ල
මොණරාගල
රත්නපුර
කළුතර
හම්බන්තොට
ගාල්ල
මාතර

ඇමුනුම 04





ඇමුනුම 05

# දීප ව්‍යාප්ත වන සත්ත්ව සමීක්ෂණය 2025/03/15
# මොණරා



ඇමුනුම 06


දීප ව්‍යාප්ත වන සත්ත්ව සමීක්ෂණය 2025/03/15
දඬුලේනා
සූචිය ( සතුන් සංඛ්‍යාව )
654 - 4235
4235- 37282
37282 - 86979
86979 - 148491
148491 - 273357
යාපනය
කිලිනොච්චි
මුලතිව්
මන්නාරම
වව්නියා
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
පුත්තලම
පොළොන්නරුව
මඩකළපුව
කුරුණෑගල
මාතලේ
නුවර
අම්පාර
ගම්පහ
කෑගල්ල
කොළඹ
නුවර එළිය
බදුල්ල
මොණරාගල
රත්නපුර
කළුතර
හම්බන්තොට
ගාල්ල
මාතර

ඇමුණුම 07

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| ගාල්ල | 22 | අම්බලන්ගොඩ | 30 | 1,183 | 115 | 4,840 |
| | | ඇල්පිටිය | 6,292 | 2,139 | 4,912 | 18,918 |
| | | ඉමදූව | 1,545 | 7,957 | 3,348 | 11,557 |
| | | කරන්දෙණිය | 1,207 | 1,578 | 400 | 6,730 |
| | | බලපිටිය | 282 | 9,373 | 439 | 4,876 |
| | | බෙන්තර | 785 | 3,406 | 149 | 4,832 |
| | | මාදම්පාගම | 74 | 517 | 107 | 1,772 |
| | | යක්කලමුල්ල | 5,870 | 7,110 | 6,003 | 18,641 |
| | | ගෝනාපීනුවල | 49 | 250 | 24 | 2,767 |
| | | තවලම | 14,144 | 3,879 | 3,474 | 15,866 |
| | | නෙළුව | 4,339 | 1,347 | 2,307 | 14,770 |
| | | නියාගම | 6,065 | 2,874 | 5,579 | 19,629 |
| | | නාගොඩ | 10,041 | 6,919 | 5,898 | 22,268 |
| | | රත්ගම | 70 | 553 | 49 | 3,379 |
| | | හික්කඩුව | 78 | 2,028 | 28 | 2,675 |
| | | බද්දේගම | 1,222 | 6,491 | 757 | 9,176 |
| | | වැලිවිට දිවිතුර | 874 | 2,196 | 1,397 | 8,535 |
| | | වඳුරඹ | 2,451 | 4,939 | 2,281 | 11,889 |
| | | බෝපෙ පෝද්දල | 45 | 3,585 | 82 | 2,722 |
| | | කඩවත් සතර | 111 | 5,340 | 300 | 1,309 |
| | | අක්මීමන | 2,125 | 15,563 | 4,339 | 16,721 |
| | | හබරාදූව | 9,884 | 11,845 | 375 | 10,703 |
| | | | **67,578** | **101,064** | **42,363** | **214,575** |

ඇමුණුම 08

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| මාතර | 16 | තිහගොඩ | 4,650 | 4,818 | 3,033 | 11,349 |
| | | පිටබැද්දර | 26,312 | 8,088 | 5,537 | 29,273 |
| | | අතුරලිය | 9,877 | 8,876 | 4,170 | 15,572 |
| | | මුලටියන | 31,762 | 4,062 | 16080 | 32173 |
| | | දෙවිනුවර | 31,557 | 10,330 | 3946 | 12174 |
| | | කිරින්ද පුහුල්වැල්ල | 5,528 | 3,162 | 6,722 | 11,185 |
| | | පස්ගොඩ | 21,887 | 6,434 | 9,457 | 21,029 |
| | | කොටපොල | 17,836 | 8,892 | 4,430 | 16,866 |
| | | හක්මණ | 13,002 | 1,032 | 9,763 | 16,080 |
| | | වැලිගම | 11,794 | 10,060 | 701 | 12,136 |
| | | කඹුරුපිටිය | 10,239 | 6,203 | 4,924 | 18,824 |
| | | අකුරැස්ස | 3,522 | 5,256 | 4,597 | 22,072 |
| | | වැලිපිටිය | 7,025 | 10,797 | 1,459 | 15,845 |
| | | මාලිම්බඩ | 1,911 | 9,888 | 523 | 13,207 |
| | | මාතර | 18,315 | 6,508 | 2,735 | 9,278 |
| | | දික්වැල්ල | 37,676 | 16,019 | 9,925 | 13,373 |
| | | | **252,888** | **120,421** | **88,002** | **270,436** |
| **හම්බන්තොට** | 12 | හම්බන්තොට | 11,275 | 24,138 | 4,964 | 25,617 |
| | | තිස්සමහාරාමය | 7,842 | 19,771 | 9,368 | 34,483 |
| | | සූරියවැව | 10,291 | 6,662 | 7,487 | 23,696 |
| | | ලුණුගම්වෙහෙර | 12,430 | 12,404 | 9,978 | 31,493 |
| | | වලස්මුල්ල | 16,397 | 1,469 | 20,007 | 23,353 |
| | | අඟුණුකොළපැලැස්ස | 16,723 | 7,856 | 17,040 | 29,045 |
| | | අම්බලන්තොට | 11,500 | 20,874 | 7,098 | 27,163 |
| | | වීරකැටිය | 24,757 | 6,873 | 24,717 | 30,708 |
| | | ඕකෙවෙල | 16,309 | 760 | 10,242 | 14,074 |
| | | තංගල්ල | 15,140 | 26,621 | 14,405 | 33,114 |
| | | බෙලිඅත්ත | 37,672 | 21,271 | 23,092 | 76,410 |
| | | කටුවන | 43,965 | 6,756 | 25,560 | 24,776 |
| | | | **224,297** | **155,452** | **173,958** | **373,932** |

ඇමුණුම 09

# දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| රත්නපුර | 18 | රත්නපුර | 12,956 | 1,758 | 4,232 | 4,340 |
| | | ඇලපාත | 18,513 | 2,391 | 4,253 | 6,286 |
| | | නිවිතිගල | 13,364 | 952 | 4,294 | 6,833 |
| | | කලවාන | 6,061 | 2,206 | 4,146 | 14,570 |
| | | කුරුවිට | 14,400 | 4,297 | 2,311 | 4,832 |
| | | ඇහැලියගොඩ | 8,455 | 1,794 | 1,475 | 2,079 |
| | | අයගම | 5,034 | 1,088 | 2,653 | 2,872 |
| | | කිරිඇල්ල | 7,503 | 4,919 | 1,353 | 4,370 |
| | | පැල්මඩුල්ල | 10,249 | 656 | 4,203 | 6,246 |
| | | කහවත්ත | 14,500 | 1,000 | 3,459 | 4,483 |
| | | ගොඩකවෙල | 14,735 | 461 | 4,810 | 5,684 |
| | | ඇඹිලිපිටිය | 54,654 | 25,321 | 44,417 | 57,587 |
| | | කොලොන්න | 44,710 | 4,872 | 19,856 | 17,820 |
| | | ඕපනායක | 12,953 | 375 | 2,926 | 3,578 |
| | | බලංගොඩ | 60,329 | 5,909 | 15,949 | 15,408 |
| | | ඉඹුල්පෙ | 32,027 | 2,744 | 10,311 | 9,746 |
| | | වැලිගෙපොල | 40,588 | 2,822 | 14,780 | 14,026 |
| | | කල්තොට | 14,423 | 7,980 | 8,108 | 9,394 |
| | | | **385,451** | **71,542** | **153,536** | **190,154** |
| කෑගල්ල | 11 | කෑගල්ල | 73,067 | 1,222 | 9,063 | 4,910 |
| | | රඹුක්කන | 48,995 | 352 | 8,034 | 6,121 |
| | | අරණායක | 48,702 | 2,228 | 10,415 | 4,118 |
| | | ගලිගමුව | 79,480 | 4,887 | 6,615 | 6,277 |
| | | දැරණියගල | 13,759 | 1,075 | 3,174 | 1,821 |
| | | රුවන්වැල්ල | 34,600 | 11,227 | 5,757 | 4,927 |
| | | වරකාපොල | 59,168 | 8,496 | 8,755 | 5,387 |
| | | යටියන්තොට | 27,484 | 9,230 | 4,755 | 3,457 |
| | | දෙහිඕවිට | 32,374 | 7,838 | 2,158 | 3,984 |
| | | බුලත්කොහුපිටිය | 54,614 | 8,081 | 4,628 | 2,875 |
| | | මාවනැල්ල | 71,864 | 2,566 | 11,211 | 7,165 |
| | | | **544,104** | **57,199** | **74,565** | **51,042** |

ඇමුණුම 10

**දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම**

| **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය** | **රිළවා** | **වඳුරා** | **දඬුලේනා** | **මොණරා** |
|---|---|---|---|---|---|---|
| බදුල්ල | 15 | බදුල්ල | 15,086 | 407 | 2,801 | 2,090 |
| | | හාලිඇල | 34,886 | 683 | 10,002 | 12,419 |
| | | ඇල්ල | 18,025 | 6,041 | 7,094 | 9,074 |
| | | බණ්ඩාරවෙල | 13,083 | 1,731 | 3,994 | 5,035 |
| | | හපුතලේ | 3,490 | 92 | 371 | 1,072 |
| | | හල්දුම්මුල්ල | 36,776 | 13,631 | 9,673 | 16,002 |
| | | වැලිමඩ | 23,164 | 2,185 | 4,457 | 12,583 |
| | | ඌවපරණගම | 42,571 | 4,280 | 18,105 | 19,963 |
| | | සොරණාතොට | 25,850 | 626 | 7,486 | 8,148 |
| | | මීගහකිවුල | 2,768 | 194 | 5,416 | 3,884 |
| | | කන්දකැටිය | 27,015 | 3,354 | 12,237 | 21,194 |
| | | රිදීමාලියද්ද | 12,178 | 3,084 | 11,704 | 20,736 |
| | | මහියංගණය | 24,475 | 11,022 | 25,317 | 49,840 |
| | | පස්සර | 46,430 | 7,158 | 13,622 | 12,387 |
| | | ලුණුගල | 33,069 | 0 | 7,019 | 9,251 |
| | | | **358,861** | **54,486** | **139,298** | **203,678** |
| **මොනරාගල** | 11 | මොනරාගල | 29,229 | 3,985 | 17,590 | 22,694 |
| | | බුත්තල | 21,796 | 6,164 | 21,308 | 36,476 |
| | | වැල්ලවාය | 41,077 | 27,163 | 33,369 | 58,608 |
| | | සෙවනගල | 7,923 | 6,391 | 8,796 | 22,995 |
| | | තණමල්විල | 38,923 | 23,776 | 20,042 | 47,792 |
| | | කතරගම | 8,226 | 12,370 | 4,109 | 12,759 |
| | | බඩල්කුඹුර | 60,060 | 6,350 | 30,820 | 39,146 |
| | | මැදගම | 12,474 | 1,271 | 18,344 | 25,167 |
| | | බිබිල | 26,798 | 2,705 | 26,841 | 41,721 |
| | | මඩුල්ල | 17,811 | 1,547 | 28,395 | 49,948 |
| | | සියඹලාණ්ඩුව | 42,763 | 6,957 | 48,748 | 102,091 |
| | | | **307,077** | **98,678** | **258,362** | **459,397** |

ඇමුණුම 11

# දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 11 | ටවුන් සහ ග්‍රැවට්ස් | 21,307 | 18,881 | 5,552 | 4,839 |
| | | කුච්චවේලි | 4,969 | 13,256 | 3,747 | 3,857 |
| | | පදවි ශ්‍රී පුර | 13,060 | 7,104 | 8,534 | 14,467 |
| | | ගොමරන්කඩවල | 3,129 | 2,624 | 2,134 | 4,078 |
| | | මොරවැව | 855 | 666 | 574 | 3,182 |
| | | තම්පලගමුව | 2,345 | 2,516 | 871 | 1,916 |
| | | කන්තලේ | 13,852 | 13,229 | 9,430 | 19,036 |
| | | වේරුගල් | 2,292 | 1,887 | 52 | 129 |
| | | සේරුවිල | 4,808 | 1,979 | 1,369 | 3,891 |
| | | මූතූර් | 6,905 | 7,033 | 1,595 | 754 |
| | | කින්නියා | 357 | 776 | 584 | 438 |
| | | | **73,877** | **69,947** | **34,442** | **56,587** |
| **මඩකළපුව** | 14 | මන්මුනෙයි උතුර | 0 | 66 | 3 | 130 |
| | | කාත්තන්කුඩි | 0 | 54 | 12 | 4 |
| | | මන්මුනෙයි පත්තු | 3 | 149 | 91 | 214 |
| | | මන්මුනෙයි දකුණ එරුවිල් පත්තු | 161 | 1,006 | 737 | 1,576 |
| | | පොරතීව් පත්තු | 419 | 1,071 | 949 | 508 |
| | | මන්මුනෙයි නිරිත | 1,489 | 2,784 | 2,592 | 3,994 |
| | | මන්මුනෙයි බටහිර | 1,194 | 2,404 | 76 | 483 |
| | | එරාවූර් නගරය | 0 | 68 | 105 | 0 |
| | | එරාවූර් පත්තු | 3,914 | 10,343 | 1,262 | 4,875 |
| | | කොරලායි පත්තු දකුණ | 509 | 727 | 258 | 432 |
| | | කොරලායි පත්තු | 417 | 1,917 | 4 | 172 |
| | | කොරලායි පත්තු බටහිර | 0 | 352 | 1,055 | 31 |
| | | කොරලායි පත්තු මධ්‍යම | 103 | 250 | 23 | 61 |
| | | කොරලායි පත්තු උතුර | 2,462 | 3,580 | 1,304 | 500 |
| | | | **10,669** | **24,767** | **8,471** | **12,980** |

ඇමුනුම 12

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| අම්පාර | 20 | මහඔය | 5,977 | 548 | 9,893 | 38,787 |
| | | දමන | 26,371 | 14,014 | 15,163 | 34,057 |
| | | ලාහුගල | 2,434 | 4,332 | 1,289 | 6,305 |
| | | උහන | 24,992 | 15,393 | 15,493 | 43,039 |
| | | අම්පාර | 10,215 | 4,172 | 7,151 | 19,403 |
| | | දෙහිඅත්තකණ්ඩිය | 4,927 | 3,905 | 6,142 | 17,609 |
| | | පදියතලාව | 8,892 | 1,840 | 17,402 | 45,012 |
| | | සයින්දමරුදු | 0 | 2 | 0 | 5 |
| | | කාරතිවු | 3 | 13 | 1 | 51 |
| | | ඉරක්කාමම් | 6,558 | 10,137 | 3,601 | 5,284 |
| | | නාවිදන්වේලි | 5 | 166 | 16 | 462 |
| | | නින්දවූර් | 0 | 88 | 0 | 88 |
| | | තිරුක්කෝවිල් | 412 | 739 | 197 | 923 |
| | | අඩ්ඩාලච්චේන | 2,987 | 3,016 | 1,570 | 3,324 |
| | | ආලයඩිවෙම්බු | 32 | 283 | 204 | 424 |
| | | කල්මුණ (උතුර) | 0 | 4 | 1 | 74 |
| | | සම්මන්තුර | 7 | 21 | 0 | 5 |
| | | පොතුවිල් | 2,927 | 10,704 | 3,286 | 2,659 |
| | | අක්කරපත්තු | 14 | 256 | 48 | 319 |
| | | කල්මුණ | 0 | 22 | 0 | 16 |
| | | | **96,747** | **69,650** | **81,457** | **217,846** |

ඇමුනුම 13

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| මහනුවර | 20 | ගඟවට කෝරළේ | 26,048 | 1,234 | 1,085 | 484 |
| | | කුණ්ඩසාලේ | 19,119 | 0 | 9,195 | 2,713 |
| | | පාතදුම්බර | 36,144 | 641 | 12,766 | 3,608 |
| | | පන්විල | 14,648 | 4,156 | 2,584 | 999 |
| | | යටිනුවර | 29,471 | 399 | 4,799 | 1,037 |
| | | උඩුනුවර | 13,206 | 1,624 | 5,546 | 1,169 |
| | | උඩපළාත | 30,035 | 3,014 | 2,876 | 1,121 |
| | | දොළුව | 45,300 | 4,350 | 2,510 | 3,200 |
| | | පාතහේවාහැට | 60,994 | 1,010 | 8,125 | 7,266 |
| | | දෙල්තොට | 17,538 | 8,559 | 3,895 | 2,504 |
| | | මැදදුම්බර | 57,580 | 3,104 | 16,510 | 10,669 |
| | | උඩදුම්බර | 41,493 | 6,550 | 11,542 | 17,841 |
| | | මිණිපේ | 9,549 | 34,451 | 26,197 | 42,388 |
| | | අකුරණ | 17,998 | 11,186 | 6,675 | 375 |
| | | පූජාපිටිය | 40,994 | 493 | 12,606 | 1,726 |
| | | හාරිස්පත්තුව | 20,292 | 683 | 5,953 | 956 |
| | | හතරලියද්ද | 51,450 | 59 | 11,148 | 2,707 |
| | | තුම්පනේ | 43,648 | 601 | 11,888 | 3,805 |
| | | ගඟ ඉහළ කෝරළේ | 34,373 | 2,188 | 5,758 | 969 |
| | | පස්බාගේ කෝරළේ | 24,794 | 2,536 | 2,271 | 1,045 |
| | | | **634,668** | **86,834** | **163,929** | **106,582** |
| මාතලේ | 11 | අඹන්ගඟකෝරළේ | 20,556 | 823 | 9,182 | 4,869 |
| | | මාතලේ | 43,474 | 2,715 | 8,381 | 3,686 |
| | | රත්තොට | 12,292 | 1,085 | 12,824 | 6,969 |
| | | පල්ලෙපොල | 21,341 | 500 | 15,527 | 10,466 |
| | | දඹුල්ල | 59,568 | 14,308 | 23,205 | 40,800 |
| | | නාඋල | 36,873 | 4,321 | 15,219 | 16,963 |
| | | ගලේවෙල | 47,472 | 10,211 | 28,393 | 32,565 |
| | | උකුවෙල | 38,122 | 0 | 10,069 | 5,076 |
| | | විල්ගමුව | 8,607 | 1,781 | 13,672 | 33,877 |
| | | ලග්ගල | 6,957 | 604 | 5,599 | 17,221 |
| | | යටවත්ත | 41,178 | 779 | 14,196 | 6,282 |
| | | | **336,437** | **37,126** | **156,267** | **178,774** |

ඇමුණුම 14

**දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම**

| **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය** | **රිළවා** | **වඳුරා** | **දඬුලේනා** | **මොණරා** |
|---|---|---|---|---|---|---|
| නුවරඑළිය | 10 | කොත්මලේ බටහිර | 10,702 | 1,616 | 1,879 | 972 |
| | | කොත්මලේ නැගෙනහිර | 6,277 | 337 | 471 | 1,017 |
| | | හඟුරන්කෙත | 56,746 | 5,132 | 15,090 | 9,417 |
| | | මතුරට | 43,625 | 5,658 | 9,218 | 9,331 |
| | | වලපනේ | 47,554 | 8,747 | 12,195 | 10,064 |
| | | නිල්දණ්ඩාහින්න | 66,515 | 7,395 | 17,989 | 15,273 |
| | | නුවරඑළිය | 3,765 | 1,072 | 535 | 460 |
| | | තලවාකැලේ | 420 | 135 | 45 | 321 |
| | | නෝර්වුඩ් | 691 | 399 | 1,376 | 629 |
| | | අඹගමුව | 17,829 | 1,397 | 2,637 | 505 |
| | | | **254,122** | **31,886** | **61,435** | **47,989** |

ඇමුණුම 15

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| කුරුණෑගල | 30 | ගිරිබාව | 7,372 | 1,600 | 13,041 | 20,637 |
| | | ගල්ගමුව | 22,452 | 2,442 | 18,291 | 33,255 |
| | | ඇහැටුවැව | 26,666 | 9,316 | 14,781 | 24,149 |
| | | මහව | 20,700 | 4,785 | 27,680 | 37,765 |
| | | අඹන්පොල | 14,648 | 2,389 | 14,289 | 22,083 |
| | | කොටවෙහෙර | 15,032 | 607 | 15,502 | 27,703 |
| | | රස්නායකපුර | 12,127 | 1,200 | 11,892 | 18,918 |
| | | නිකවැරටිය | 6,870 | 166 | 14,483 | 20,173 |
| | | පොල්පිතිගම | 59,259 | 13,893 | 39,052 | 63,537 |
| | | ඉබ්බාගමුව | 43,995 | 1,547 | 27,674 | 28,067 |
| | | ගනේවත්ත | 20,074 | 1,289 | 18,675 | 23,420 |
| | | රිදීගම | 56,548 | 1,285 | 41,548 | 26,136 |
| | | මාවතගම | 22,722 | 151 | 12,475 | 9,727 |
| | | මල්ලවපිටිය | 13,460 | 258 | 7,018 | 4,316 |
| | | කුරුණෑගල | 14,079 | 502 | 11,782 | 9,301 |
| | | මාස්පොත | 6,283 | 706 | 9,023 | 9,119 |
| | | වීරඹුගෙදර | 13,977 | 44 | 14,934 | 13,567 |
| | | පොල්ගහවෙල | 22,315 | 416 | 11,984 | 10,594 |
| | | අලව්ව | 48,922 | 1,266 | 16,006 | 7,922 |
| | | නාරම්මල | 15,708 | 127 | 14,698 | 10,312 |
| | | කුලියාපිටිය නැගෙනහිර | 8,370 | 700 | 16,372 | 18,025 |
| | | කුලියාපිටිය බටහිර | 8,865 | 533 | 27,985 | 21,222 |
| | | වාරියපොල | 13,484 | 281 | 32,457 | 39,732 |
| | | පඩුවස්නුවර නැගෙනහිර | 3,980 | 124 | 15,441 | 15,556 |
| | | පඩුවස්නුවර බටහිර | 9,319 | 234 | 22,718 | 25,576 |
| | | බමුණාකොටුව | 11,809 | 889 | 15,148 | 16,739 |
| | | බිංගිරිය | 5,410 | 134 | 15,118 | 17,562 |
| | | උඩුබද්දාව | 4,023 | 94 | 10,477 | 11,925 |
| | | කොබෙයිගනේ | 2,806 | 111 | 11,374 | 16,412 |
| | | පන්නල | 9,690 | 144 | 24,797 | 18,067 |
| | | | **540,958** | **47,224** | **546,715** | **621,517** |

ඇමුණුම 16

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| පුත්තලම | 16 | දංකොටුව | 94 | 30 | 462 | 4,164 |
| | | වෙන්නප්පුව | 24 | 6 | 35 | 926 |
| | | නාත්තණ්ඩිය | 58 | 20 | 813 | 3,723 |
| | | මහවැව | 2,225 | 86 | 2,226 | 4,660 |
| | | මාදම්පේ | 2,896 | 118 | 10,942 | 9,356 |
| | | හලාවත | 3,439 | 271 | 8,296 | 13,283 |
| | | ආරච්චිකට්ටුව | 3,768 | 26 | 8,989 | 13,049 |
| | | මුන්දලම | 5,368 | 1,485 | 9,506 | 18,759 |
| | | කල්පිටිය | 39 | 21 | 173 | 1,958 |
| | | පුත්තලම | 9,968 | 4,113 | 9,506 | 12,417 |
| | | කරුවලගස්වැව | 12,958 | 3,341 | 11,889 | 21,175 |
| | | නවගත්තේගම | 5,594 | 449 | 8,669 | 18,957 |
| | | ආණමඩුව | 13,310 | 479 | 22,338 | 35,588 |
| | | පල්ලම | 2,140 | 1,013 | 10,364 | 14,731 |
| | | මහකුඹුක්කඩවල | 8,969 | 156 | 10,846 | 21,715 |
| | | වනාතවිල්ලුව | 23,316 | 13,293 | 12,851 | 22,092 |
| | | | **94,163** | **24,904** | **127,905** | **216,553** |

**දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 22 | කහටගස්දිගිලිය | 27,466 | 10,903 | 16,985 | 39,432 |
| | | ගල්නෑව | 27,487 | 8,218 | 13,118 | 19,891 |
| | | මැදවච්චිය | 24,260 | 5,634 | 19,086 | 40,485 |
| | | තිරප්පනේ | 24,717 | 6,461 | 15,183 | 37,628 |
| | | තඹුත්තේගම | 8,664 | 1,108 | 10,115 | 16,207 |
| | | පලාගල | 42,519 | 17,177 | 16,327 | 29,961 |
| | | නොච්චියාගම | 11,199 | 660 | 13,957 | 25,757 |
| | | ඉපලෝගම | 24,826 | 7,989 | 13,749 | 20,291 |
| | | රාජාංගනය | 3,606 | 314 | 12,766 | 17,468 |
| | | පදවිය | 12,515 | 7,663 | 9,141 | 15,867 |
| | | මහ විලච්චිය | 6,826 | 2,725 | 9,011 | 24,461 |
| | | පලුගස්වැව | 9,862 | 1,966 | 6,583 | 16,005 |
| | | කැබතිගොල්ලෑව | 30,503 | 10,278 | 14,750 | 39,652 |
| | | මධ්‍යම නුවරගම් පළාත | 38,526 | 14,099 | 22,087 | 47,077 |
| | | නාච්චාදූව | 1,849 | 878 | 2,738 | 5,309 |
| | | රඹෑව | 25,247 | 4,838 | 14,473 | 34,794 |
| | | හොරොව්පතාන | 25,199 | 16,693 | 17,968 | 27,577 |
| | | ගලෙන්බිඳුණු වැව | 18,598 | 4,231 | 14,579 | 29,163 |
| | | නැගෙනහිර නුවරගම් පළාත | 9,729 | 6,044 | 6,979 | 10,364 |
| | | තලාව | 19,766 | 2,270 | 17,410 | 30,963 |
| | | මිහින්තලය | 20,793 | 9,580 | 11,531 | 24,522 |
| | | කැකිරාව | 47,771 | 20,590 | 18,447 | 28,615 |
| | | | **461,922** | **160,315** | **296,983** | **581,489** |
| **පොළොන්නරුව** | **7** | මැදිරිගිරිය | 23,595 | 22,911 | 19,535 | 39,177 |
| | | වැලිකන්ද | 17,728 | 13,962 | 5,543 | 17,173 |
| | | දිඹුලාගල | 38,446 | 26,375 | 24,931 | 46,416 |
| | | හිඟුරක්ගොඩ | 23,730 | 16,857 | 11,271 | 24,555 |
| | | ඇලහැර | 29,418 | 13,926 | 18,087 | 30,213 |
| | | ලංකාපුර | 2,772 | 4,165 | 1,701 | 9,745 |
| | | තමන්කඩුව | 17,158 | 10,464 | 5,422 | 18,673 |
| | | | **152,844** | **108,658** | **86,490** | **185,952** |

ඇමුණුම 18

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වදුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| කළුතර | 14 | මතුගම | 9,036 | 7,420 | 1,197 | 5,837 |
| | | අගලවත්ත | 9,826 | 3,353 | 3,124 | 7,062 |
| | | බේරුවල | 508 | 3,872 | 194 | 3,455 |
| | | දොඩන්ගොඩ | 14,019 | 7,709 | 341 | 5,277 |
| | | පානදුර | 91 | 4,169 | 46 | 645 |
| | | ඉංගිරිය | 1,938 | 1,222 | 421 | 1,219 |
| | | හොරණ | 675 | 6,078 | 239 | 2,633 |
| | | බුලත්සිංහල | 10,780 | 3,672 | 4,034 | 10,111 |
| | | බණ්ඩාරගම | 325 | 5,090 | 53 | 363 |
| | | මිල්ලනිය | 4,456 | 11,785 | 184 | 3,876 |
| | | මදුරාවල | 5,901 | 6,013 | 237 | 3,462 |
| | | වලල්ලාවිට | 17,363 | 10,724 | 7,872 | 20,837 |
| | | පාලින්දනුවර | 9,097 | 2,286 | 7,711 | 16,425 |
| | | කළුතර | 394 | 6,721 | 111 | 1,521 |
| | | | **84,406** | **80,112** | **25,764** | **82,723** |
| කොළඹ | 13 | පාදුක්ක | 2,880 | 4,806 | 1,044 | 2,196 |
| | | සීතාවක | 16,933 | 9,209 | 1,219 | 2,861 |
| | | කැස්බෑව | 44 | 5,248 | 10 | 178 |
| | | හෝමාගම | 202 | 13,834 | 704 | 1,707 |
| | | මහරගම | 156 | 6,304 | 69 | 178 |
| | | කොළොන්නාව | 105 | 1,316 | 54 | 59 |
| | | කෝට්ටේ | 36 | 162 | 76 | 47 |
| | | කොළඹ | 4 | 14 | 50 | 45 |
| | | මොරටුව | 58 | 457 | 70 | 110 |
| | | තිඹිරිගස්යාය | 14 | 11 | 15 | 20 |
| | | දෙහිවල | 4 | 20 | 6 | 14 |
| | | රත්මලාන | 32 | 120 | 3 | 110 |
| | | කඩුවෙල | 1,727 | 10,397 | 94 | 472 |
| | | | **22,192** | **51,895** | **3,414** | **7,997** |

ඇමුණුම 19

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| ගම්පහ | 13 | මීගමුව | 1 | 0 | 0 | 83 |
| | | කැළණිය | 18 | 19 | 5 | 11 |
| | | කටාන | 27 | 13 | 26 | 685 |
| | | ජා ඇල | 33 | 0 | 2 | 83 |
| | | බියගම | 44 | 542 | 26 | 172 |
| | | ගම්පහ | 85 | 115 | 145 | 318 |
| | | වත්තල | 142 | 15 | 139 | 444 |
| | | මිනුවන්ගොඩ | 244 | 247 | 1,531 | 1,116 |
| | | මහර | 2,704 | 3,320 | 1,977 | 1,751 |
| | | දොම්පෙ | 6,717 | 19,239 | 1,748 | 5,162 |
| | | අත්තනගල්ල | 10,435 | 2,900 | 10,442 | 4,852 |
| | | දිවුලපිටිය | 12,597 | 424 | 11,424 | 7,084 |
| | | මීරිගම | 45,029 | 7,948 | 16,962 | 5,955 |
| | | | **78,072** | **34,780** | **44,427** | **27,716** |

ඇමුණුම 20

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රිළවා | වඳුරා | දඬුලේනා | මොණරා |
|---|---|---|---|---|---|---|
| යාපනය | 15 | යාල්පානම් | 4 | 18 | 0 | 3 |
| | | නල්ලූර් | 0 | 0 | 0 | 0 |
| | | උඩුවිල් | 0 | 0 | 0 | 0 |
| | | තෙල්ලිප්පලෙ | 0 | 62 | 4 | 166 |
| | | කාරෙරෙනගර් | 0 | 0 | 0 | 0 |
| | | වංකාණෛ | 0 | 1 | 0 | 0 |
| | | වාවකච්චේරි | 621 | 20,979 | 1,247 | 921 |
| | | වන්ඩිල්ප්පායි | 0 | 8 | 0 | 0 |
| | | වේලණෛ | 0 | 0 | 0 | 0 |
| | | ඌර්කාවට්රෙ | 1 | 0 | 0 | 0 |
| | | පරුත්තිතුරෙ | 0 | 30 | 0 | 29 |
| | | කරවෙට්ටි | 13 | 91 | 46 | 80 |
| | | නෙඩුන්තීව් | 0 | 0 | 0 | 0 |
| | | කෝප්පයි | 0 | 5 | 0 | 73 |
| | | මරුත්තන්කේණි | 45 | 83 | 12 | 98 |
| | | | **683** | **21,274** | **1,309** | **1,370** |
| **මුලතිව්** | **6** | කරෙරෙතුරෙපට්ටෘ | 20,851 | 21,935 | 6,018 | 7,101 |
| | | පුදුකුඩුඉරුප්පු | 12,048 | 11,500 | 2,829 | 2,807 |
| | | ඔඩ්ඩුසුඩ්ඩාන් | 17,972 | 15,320 | 6,731 | 16,769 |
| | | තුණුක්කායි | 13,691 | 12,115 | 2,940 | 7,219 |
| | | මාන්තෛකිලක්කු | 8,420 | 8,288 | 2,141 | 4,501 |
| | | වැලිඔය | 4,175 | 1,988 | 2,800 | 5,906 |
| | | | **77,156** | **71,145** | **23,459** | **44,303** |
| **කිලිනොච්චි** | **4** | කරච්චි | 16,021 | 14,688 | 7,923 | 9,739 |
| | | කන්දවලි | 6,442 | 7,902 | 2,310 | 2,384 |
| | | පච්චිලයි පල්ලි | 12,960 | 19,341 | 8,258 | 4,549 |
| | | පූන්කරි | 2,819 | 15,077 | 2,751 | 3,773 |
| | | | **38,241** | **57,007** | **21,242** | **20,445** |
| **මන්නාරම** | **5** | මන්නාර් නගරය | 895 | 2,807 | 376 | 3,260 |
| | | මාන්තෛ | 5,768 | 13,539 | 7,037 | 11,966 |
| | | නානාට්ටාන් | 4,954 | 7,262 | 2,049 | 3,176 |
| | | මුසලි | 3,470 | 4,608 | 1,756 | 4,554 |
| | | මඩු | 10,661 | 10,889 | 5,431 | 14,005 |
| | | | **25,747** | **39,104** | **16,649** | **36,961** |

ඇමුණුම 21

## දිස්ත්‍රික්කයන් තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ අනුව සත්ත්ව ගහනයේ පැතිරීම

| **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය** | **රිළවා** | **වඳුරා** | **දඬුලේනා** | **මොණරා** |
|---|---|---|---|---|---|---|
| වව්නියාව | 4 | වව්නියාව නගරය | 25,701 | 27,654 | 11,415 | 17,628 |
| | | වව්නියාව දකුණ | 16,347 | 8,222 | 7,062 | 19,078 |
| | | වව්නියාව උතුර | 17,112 | 19,820 | 9,065 | 20,849 |
| | | වෙන්ගල චෙඩ්ඩිකුලම් | 15,202 | 16,463 | 8,646 | 17,192 |
| | | | **74,361** | **72,158** | **36,188** | **74,747** |